**ශීර්ෂය 301 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 301 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 301-1-1-1505 වැය විෂය යටතේ NEDAC/ICT සහ CICTAB ආයතන වල සාමාජික මුදල් ගෙවීම රු.1,505,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. මෙසේ ප්‍රතිපාදනයක් සිදුකර තිබුණද. එම ආයතනවල සාමාජිකත්වය තව දුරටත් පවතින්නේ ද යන්න විගණනයට තහවුරුවක් නොවිය. | එකඟ වේ. මෙමඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලැබුයේ මෙම ආයතනයන්හි සාමාජිකත්වය පවත්වාගෙන යාම වෙනුවෙන් සාමාජික මුදල් ගෙවීම සඳහා වන අතර 2022 වර්ෂයේ සාමාජික මුදල් ගෙවීම් කිරීම සඳහා ඉන්වොයිසියන් ඉදිරිපත් කර නොතිබුණි. | අවශ්‍යතාවය සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිපාදනයන් සිදු කල යුතුය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැරකම් වටිනාකම රු.284,762 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) ආකෘතියේ දක්වා නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදි නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට වගබලා ගත යුතුය. |
| (ආ) | වැය විෂයයන් 6 ක් සඳහා වූ රු.307,595 ක බැරකම් නිදහස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ අතර එම වැය විෂයයන්හි ඉතිරි ප්‍රතිපාදනය රු.51,712 ක් පමණක් විය. | එකඟ වේ. ප්‍රතිපාදන ක්‍රමානුකකූලව උපයෝජනය කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැඳීමට වගබලා ගත යුතුය. |

### 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතිකවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත අභ්‍යන්තර විගණක පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇති | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට ක්‍රියාකල යුතුයි. |

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික වියයුතු වුවත්. වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | නමුත් මේ දක්වා ඒ සඳහා නිලධාරීන් අනුයුක්ත කර නොමැති අතර, වියදම් පාලනය කිරීම යටතේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමටද අවකාශයක් ලැබී නොමැත. | |

**2.4** තැන්පතු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වන්දි සම්බන්ධයෙන් වූ පොදු තැන්පත් ගිණුමේ (6000-0-0-17-0-32) 2022 ජනවාරි 01 දිනට ශේෂය රු.2,903,644 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ රු.2,879,594 ක ශේෂයක් පැවතුණි. ඒ අනුව වර්ෂය තුල රු.24,050 ක ශේෂයක් පමණක් නිරවුල් වී තිබුණි. | | |
| | මෙම තැන්පතු වර්ෂ 08ක සිට 12 ක් දක්වා කාලයක සිට පවතින ශේෂයන් වූ අතර, පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කල දිනය සඳහන් කර තිබුණ ද වර්ෂ අවසාන සිගැස් ශේෂ ලැයිස්තුවේ ඉහත ශේෂයන් 2015 දෙසැම්බර් 31 ලෙස සඳහන් කර තිබුණි. | මේ සම්බන්ධව නිශ්චිත තොරතුරු සොයා ගත නොහැකි වී ඇති අතර අරමුදල සතුව තිබූ ගිණුම් යම් නිශ්චිත හේතුමත රජයේ ගිණුමට තැන්පත් කරන ලද බවට හා සිගාස් පද්ධතියට 2015 වර්ෂයේ ඇතුළත් කරන ලද බවට අනුමාන කළ හැකිය. | තැන්පතු ගිණුමට මාරුකල දිනය නිවැරදිව සටහන් කිරීමට වගබලා ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ 2 ට වඩා පැරණි තැන්පත් රාජ්‍ය ආදායමට බැර කලයුතු වුවත් රු.2,879,594 ක වන්දි මුදල් වර්ෂ 8 සිට වර්ෂ 12 ක් අතර කාලපරාසයක් තිස්සේ ආදායමට නොගෙන පැවතුන අතර එසේ සිදු නොකිරීමට හේතුව ලෙස වන්දි සම්බන්ධ නඩු අවසන් වී නොමැති බව තැන්පත් ගිණුමේ සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. එසේ වුවත් එම ශේෂ සියල්ලට අදාලව නඩු කටයුතු අවසන් නොමැති බවට ප්‍රමාණවත් තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පොදු තැන්පත් ගිණුමේ මෙවැනි තැන්පත් ශේෂයක් ඉදිරියට ඒමට එක් හේතුවක් වන්නේ ආරවුල් බේරුම්කරණ සඳහා සමිතිවලින් තැන්පත් කරනු ලබන ආරවුල් බේරුම්කරණ ගාස්තු හා ආරවුල් බේරුම්කරණ උසාවි බලගැන්වීමෙන් පසු උසාවිවලින් අය වන උසාවි දඩ මුදල් දිගු කාලයක් තිස්සේ මෙම ගිණුමට මාරු කර තිබීමට අවශ්‍ය වූ බැවිණි. ආරවුල් බේරුම්කරණ විභාග විවිධ හේතුන් මත අතරමග අත්හිටුවීමට සිදුව ඇත. එම මුදල් ආරවුල් බේරුම්කරණ නිලධාරියාට නොගෙවන අතර සමිතිය විසින් ආපසු නොඉල්ලීම් මත මෙම ගිණුමේ රැඳී පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | උසාවි දඩ මුදල් සමිති වෙත මුදා නොහැරීම ආරවුල් බේරුම්කරණ අංකය සඳහන් නොකර නඩු අංකය පමණක් සඳහන් කර දඩ මුදල් එවා ඇති අවස්ථාවලදී දෙපාර්තමේන්තුවේ සිටි විෂයභාර නිලධාරීන්ට එම කරුණු නිරවුල් කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියා කිරීමට නොහැකි වීම. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෙටුම්පත් කාර්යසාධන වාර්තා අනුව ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති 08 ට අදාල ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් වූ ක්‍රියාකාරකම් 50 කින් ක්‍රියාකාරකම් 22 ක් ම ඉටු කර නොතිබුණි. | අංශයේ කටයුතු කිරීමට නිලධාරීන් නොමැති වීම මත කළහැකි ක්‍රියාකාරකම් ගණන සීමාසහිත විය. | සැලසුම් ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් අංශ 08 ක් සඳහා ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් වූ ක්‍රියාකාරකම් 270න් ක්‍රියාකාරකම් 97 ක් ඉටුකර නොතිබුණි. | පිළිගනිමි.<br>අංශවලට අනුයුක්තව සිටින නිලධාරීන් සංඛ්‍යාව සහ රට තුළ පැවති අර්බුදකාරි තත්ත්වය මත හැකි උපරිම අයුරින් කටයුතු කිරීම සිදුව ඇත. | සැලසුම් ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතුය. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් 'බී' ගිණුමේ ඇමුණුම 05 ට අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර වෙනසට හේතු පැහැදිලි කල යුතු වුවත් රු.160,598 ක් වූ වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි. | වසර ගණනාවක සිට පැවත එන ශේෂයක් වනඅතර නිරවුල් කිරීමට මුලාශ්‍ර සොයාගැනීමේ අපහසුතාවයක් පවතී. කෙසේ වුවද නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමට වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශ වලට ස්ථාන මාරු වී ගිය අය නොවූ ණය ශේෂ අතර වසර 33 ක් පැරණි රු.40,172 ක ණය ශේෂයක් පැවති අතර, පළාත් සභා ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 32 ක් පැරණි ණය ශේෂ වටිනාකම රු.47,353 ක් බව නිරීක්ෂණය විය. 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අදාලව නිකුත් කල මාර්ගෝපදේශ අංක 01 හි සඳහන් පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. | ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ස්ථාන මාරු වී ගිය, අය නොවී පැවති වර්ෂ 30 ක් පැරණි රු.19,262 ක හා වර්ෂ 23 ක් පැරණි රු.40,650 ක ණය ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂයේදී ගිණුමෙන් ඉවත් කර තිබුණු අතර එසේ ඉවත් කිරීමට අදාල භාණ්ඩාගාර අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවුනි. | නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ නිශ්චිත තහවුරු කිරීම මත නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | අනුමැතිය ලබා ගෙන නිරවුල් කිරීමට වගබලා ගත යුතුය. |
| (ඈ) | වැඩ තහනම් කල නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.70,401 ක ණය ශේෂයක් වසර 25 ක් තිස්සේ අයනොවී පැවතුණු අතර සේවය හැරගිය නිලධාරීයෙකුගෙන් අයවිය යුතු රු.48,720 ක ණය ශේෂයක් වසර 41 ක කාලයක සිට අය නොවී පැවතුණි.ඒ සම්බන්ධයෙන් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අදාලව නිකුත් කල මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල පුද්ගලයින්ගේ තොරතුරු සොයමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර ණය ශේෂ නිරවුල් කිරීමට ක්‍රියා කල යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 ජූලි 17 දිනැති අංක 4/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඉටුකර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මෙහි ක්‍රියාකාරකම් සඳහා තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගැනීමට ක්‍රියාකල යුතුයි. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත අභ්‍යන්තර විගණක පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් කර ඇති නමුත් මේ දක්වා ඒ සඳහා නිලධාරීන් අනුයුක්ත කර නොමැති අතර, වියදම් පාලනය කිරීම යටතේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමටද අවකාශයක් ලැබී නොමැත. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට ක්‍රියාකල යුතුයි. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6 න් නියෝජ්‍ය කොමසාරිස් තනතුරක් හා සහකාර කොමසාරිස් තනතුරු 2 ක් වසර 5 කට වැඩි කාලයක සිටද, දෙපාර්තමේන්තුගත නියෝජ්‍ය කොමසාරිස් තනතුර, අභ්‍යන්තර විගණක තනතුර හා නීති නිලධාරී තනතුර වර්ෂ 3 ක කාලයක සිටද පුරප්පාඩුව පැවතුණි. | නියෝජ්‍ය කොමසාරිස් තනතුර,සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර ශ්‍රේණි උසස් වීමක් වන අතර ඒ සඳහා සුදුසුකම්ලත් නිලධාරියෙක් දෙපාර්තමේන්තුවේ කාරිය මණ්ඩලය තුල නොමැත. එසේ වුවද සහකාර කොමසාරිස් තනතුරෙහි ජ්‍යෙෂ්ඨතම නිලධාරියා රාජකාරී ඉටු කිරීම සඳහා පත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන ඇත.2021.08.02 දින නිලධාරියෙකු පත් කරන ලදී.ඒ අනුව එම නිලධාරියා 2022.02.08 දින ස්ථාන මාරු වීම ලබා ඇත. දැනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු සහකාර කොමසාරිස් තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලබයි. අභ්‍යන්තර විගණන තනතුරේ පුරප්පාඩු සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් එම පුරප්පාඩුව සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති නමුත් මේ දක්වා පුරප්පාඩුව සඳහා නිලධාරියෙකු අනුයුක්ත කර නොමැත.නීති නිලධාරී තනතුරේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය 2022.06.27 දින ලැබී ඇති නමුත් මුදල් අමාත්‍යාංශයේ අංක | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | BD/CBP/01/01/04-2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව බඳවා ගැනීම් නැවැත්වීම මත මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. | |
| (ආ) | ද්විතියික මට්ටමේ වූ භාෂා පරිවර්තක තනතුර වර්ෂ 5 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | 2023.04.28 දක්වා එම තනතුර කොන්ත්‍රාත් කාල දීර්ඝ කරමින් පුරප්පාඩුව පිරවීමට කටයුතු කර ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුය. |